ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා සමාගම - 2022

------------------------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මතය

ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා සමාගමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සමාගම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී.ලං.ගි.ප්‍ර.-16 හි 51 වගන්තියට අනුව, වත්කම්වල ශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් වන්නේ නම්, ශ්‍රී.ලං.ගි.ප්‍ර.-8 අනුව වෙනස්කම් ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් වශයෙන් ගිණුම් තබනු ලැබිය යුතුය. කෙසේ වුවද, රු. මිලියන 8.56 ක් වූ සමාගම විසින් භාවිතා කරනු ලබන, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ඒ ආකාරයෙන් සමාලෝචනය කර නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම ලබා දී නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. |
| (ආ)දේපළ, පිරියත සහ උපකරණ ප්‍රාග්ධනීකරණ ප්‍රතිපත්තිය 2022 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය ප්‍රකාශනවල හෙළදරව් කර නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම ලබා දී නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 507(2). | සෑම ස්ථාවර වත්කමකම සත්‍ය පැවැත්ම දෙසැම්බර් 31 වැනි දින සත්‍යාපනය කළ යුතු අතර, එහි තත්ත්වය සටහන් කළ යුතුය. නමුත් සමාගම 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් සත්‍යාපනයක් හෝ භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | සමාගම විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් කරන ලද ඉල්ලීම මත පදනම්ව, 2022 ජුනි මාසයේදී විශේෂ ස්ථාවර වත්කම් සත්‍යාපනයක් සිදු කරන ලදී. ඒ අනුව, සමාගම විසින් 2022 දෙසැම්බර් 31 වන දිනට වත්කම් සත්‍යාපනයක් සිදු නොකරන ලදී. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2015 මැයි 25 දිනැති අංක: පීඊඩී 01/2015 දරන චක්‍රලේඛය, | චක්‍රලේඛවල විධිවිධාන අනුව , එක් නිල වාහනයක් සහ මසකට ලීටර් 135 සහ 115 ට සමාන ඉන්ධන දීමනාවක් හෝ රු. 50,000 ක මාසික ඉන්ධන දීමනාවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද ඕනෑම රජය සතු ව්‍යවසායක (SOE) HM 1-1 කාණ්ඩයේ හෝ ඊට ඉහළ | මෙම චක්‍රලේඛයේ දක්වා ඇති දීමනා ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා ලිමිටඩ්, පරිපාලිත සමාගමක කාණ්ඩය යටතට ගැනෙන බැවින්, එයට අදාළ නොවේ. සභාපතිවරයාට, ප්‍රධාන | මව් සමාගම විසින් උපදෙස් දී ඇති පරිදි, රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| 2022 ජනවාරි 14 දිනැති අංක: 01/2015(ii) දරන චක්‍රලේඛය, සහ 2020 ජනවාරි 27 දිනැති අංක: පීඊඩී 01/2020 දරන චක්‍රලේඛය. | නිලධාරියෙකුට හෝ ඉහත තනතුරු දරන නිලධාරියාට හිමි වේ. කෙසේ වුවද, චක්‍රලේඛවලට පටහැනිව,<br>(i) නිල වාහනයකට හිමිකම් නොලබන නිලධාරීන් 11 දෙනෙකු සඳහා නිල වාහන හෝ මාසික දීමනාව වශයෙන් එකතුව රු. මිලියන 5.7ක් ගෙවා තිබුණි.<br>(ii) සමාගම සේවකයින් හය දෙනෙකු සඳහා රු. 143,000 සිට රු. 300,300 දක්වා මාසික වාහන දීමනාවක් සහ ලීටර් 200 සිට ලීටර් 320 දක්වා මාසික ඉන්ධන දීමනාවක් ලබා දී තිබුණි. | විධායක නිලධාරියාට, අධ්‍යක්ෂ මණ්ඩලයට දීමනා ගෙවීම තරඟකාරී වෙළඳපල මිල ගණන් සැලකිල්ලට ගෙන අදාළ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතුය. ඒ අනුව සහ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය අනුව, පී.ඊ.ඩී. 01/2015 වෙනුවට, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකුගෙන් සමන්විත වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මෝටර් රථ ප්‍රතිපත්තිය අනුගමනය කරන ලදී. | |
| (ඇ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2015 මැයි 25 දිනැති අංක: පීඊඩී 01/2015 දරන චක්‍රලේඛය, 2020 ජනවාරි 27 දිනැති අංක: පීඊඩී 01/2020 දරන චක්‍රලේඛය. | (i) නිලධාරියෙකු තනතුරු එකකට වඩා දරන්නේ නම්, එම පුද්ගලයාගේ ස්ථාවර තනතුර සඳහා නියම කර ඇති ඉන්ධන දීමනාව පමණක් ලබා ගැනීමට හිමිකම් ඇත. කෙසේ වුවද, සමාගම් දෙකෙහිම සභාපති/ප්‍රධාන විධායක නිලධාරී තනතුරු දැරූ හිටපු සභාපති/ප්‍රධාන විධායක නිලධාරී ලිට්‍රෝ ගෑස් ලංකා සමාගමෙන් ලබාගත් දීමනාවට අමතරව, රු.443,300ක මාසික වාහන දීමනාවක් 2022 මැයි මාසය දක්වා සමාගමෙන් ලබාගෙන ඇත. එසේම මෙම මුදල චක්‍රලේඛයෙන් අවසර දී ඇති රු.50,000 ක් වූ මාසික දීමනා සීමාව ඉක්මවන ලදී. චක්‍රලේඛයට අනුව, ලීටර් 150 ඉක්මවා ලීටර් 500ක මාසික ඉන්ධන දීමනාවක් හිටපු සභාපති/ප්‍රධාන විධායක නිලධාරී වෙත ලබා දී තිබුණි.<br>(ii) සමාගමේ හිටපු සභාපති/ප්‍රධාන විධායක නිලධාරියාට 2022 මැයි මාසය දක්වා රු. 50,000ක මාසික රියදුරු දීමනාව සහ රු. 150,000ක මාසික විනෝදාස්වාද දීමනාව ද ගෙවා තිබුණි.<br>(iii) විධායක නොවන අධ්‍යක්ෂවරයාට (NED) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි වීමේ දීමනාව පමණක් හිමි වුවද, විධායක නොවන අධ්‍යක්ෂවරු (NED) | සභාපති, විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ නිරීක්ෂකයින් සඳහා දීමනා ගෙවීම සහ ප්‍රවාහන පහසුකම් සැපයීම සමාගමේ සංස්ථා පත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලියේ අයිතම අංක 83, 76, 77 සහ 78 සහ වගන්තිවලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබයි. | මව් සමාගම විසින් උපදෙස් දී ඇති පරිදි, රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිදෙනෙකු සඳහා මාසිකව රු. 100,000 ක වාහන දීමනාවක් ගෙවා තිබුණි. | | |
| (ඇ)2022 දෙසැම්බර් 21 දිනැති අංක පීඊඩී 09/2022 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | 2021 මූල්‍ය වර්ෂය තුළ ලාභ උපයා ඇති සහ දිරි දීමනා ගෙවා ඇති වාණිජ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වලට සේවකයකු සඳහා රු. 20,000 ක ප්‍රසාද දීමනාවක් යෝජනා කළ හැකිය. කෙසේ වුවද, සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ සේවකයෙකු සඳහා රු. 60,000 ක ප්‍රසාද දීමනාවක් ගෙවා ඇත. | CBA නොවන සේවකයින්ගේ වාර්ෂික කාර්යසාධනය පදනම් කරගත් ප්‍රසාද දීමනාව සාපේක්ෂ තනි පුද්ගල කාර්යසාධනය සහ සමාගමේ කාර්යසාධනය මත තීරණය වේ. ප්‍රසාද දීමනා ගෙවීමේ මාස ගණන CBA සේවකයාගේ ගෙවීමට අනුකූල විය යුතුය. පීඊඩී චක්‍රලේඛවල අදාළත්වය සහ එම චක්‍රලේඛ උපයෝගී කර ගැනීමේ හැකියාව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබයි. | සමාගම චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. යම් අපගමනයක් අවශ්‍ය වන්නේ නම්, මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඉ) 2014 අගෝස්තු 08 දින මණ්ඩලය විසින් සම්මත කරන ලද 2014 අංක 04 චක්‍රලේඛ යෝජනාව. | යෝජනාවට අනුව, 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්ත නියාමන (සංශෝධන) පනතට අනුව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙන් කිරීමේ අරමුණ වෙනුවෙන් රු. මිලියන 100 ක පොළී රහිත අත්තිකාරම් සීමාසහිත ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංග්ස් ලිමිටඩ් (SLIHL) වෙත මාරු කර ඇත. සීමාසහිත ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංග්ස් ලිමිටඩ් (SLIHL) මගින් මෙය මුදලින් හෝ ලාභාංශ පියවීමක් මගින් හෝ 2015 අගෝස්තු 31 දින හෝ ඊට පෙර ආපසු ගෙවිය යුතුය. සීමාසහිත ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංග්ස් ලිමිටඩ් (SLIHL) සංස්ථාපනය කිරීමේ දී, ඉහත කී මූලික කොටස් දෙක මහා භාණ්ඩාගාර ලේකම්වරයා වෙත ප්‍රායෝගිකව හැකි ඉක්මනින් පැවරීමට නියමිතය යන අවබෝධය මත සමාගමේ එවකට සිටි සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ, එක් එක් කොටස් සඳහා සාමාන්‍ය කොටස් එක බැගින් හිමි ආරම්භක කොටස් හිමියන් ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද, සීමාසහිත ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංග්ස් ලිමිටඩ් (SLIHL) මගින් මෙම අත්තිකාරම් මුදල මේ දක්වා ආපසු ගෙවා නොතිබුණු අතර එවැනි අත්තිකාරම් පියවීමක් සම්බන්ධයෙන් සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංග්ස් ලිමිටඩ් | 2022/5/20 දින පැවති කෝප් රැස්වීමේදී මේ පිළිබඳව සාකච්ඡා කර ඇති අතර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ආයතනය ඇවර කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටින බව එහි ප්‍රධාන විධායක නිලධාරියා විසින් තහවුරු කර තිබුණි. ඇවර කිරීමේ ක්‍රියාවලිය අවසන් වූ පසුව, එම මුදල SLIC වෙත මාරු කරනු ඇත. | අය විය යුතු මුදල් ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංග්ස් ලිමිටඩ් (SLIHL) වෙතින් අයකර ගැනීමට සමාගම විසින් අවශ්‍ය පියවර ගත යුතුය. |

(SLIHL) අතර ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණි. තවද, සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ වාර්තාවලට අනුව, සීමාසහිත ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංග්ස් ලිමිටඩ් (SLIHL) හි සම්පූර්ණ කොටස් දෙක මේ වන තෙක් මහා භාණ්ඩාගාරය වෙත පවරාගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 1159.6 ක ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ එයට අනුරූප ලාභය රු.මිලියන 1200.8 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 41.2 ක අඩුවීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ආදායම රු. මිලියන 172 කින් අඩුවීම සහ පරිපාලන වියදම් රු.මිලියන 96 කින් වැඩි වීම මෙම පහත වැටීමට හේතු විය.

### 2.2 ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම විශ්ලේෂණය වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟ ඉකුත් වර්ෂ දෙක (02) හා සැසඳීමේ දී පහත පරිදි වේ.

| | මුදල රු. මිලියන | | | වෙනසේ ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2022 | 2021 | 2020 | % 2022 | % 2021 | % 2020 |
| ගනුදෙනුකරුවන් සමඟ පවතින ගිවිසුම්වලින් ලැබෙන ආදායම | 1,444 | 1,616 | 1,508 | -10.6 | 7 | -27 |
| විකුණුම් පිරිවැය | 319 | 316 | 327 | 1 | -3 | 4 |
| මූල්‍ය ආදායම | 520 | 304 | 517 | 71 | -41 | -26 |
| මූල්‍ය වියදම | 17 | 28 | 83 | -38.5 | -66 | -38 |

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂ දෙක (02) සමඟ සැසඳීමේ දී, ප්‍රධාන අනුපාත පහත දක්වා ඇති පරිදි වේ.

| වර්ෂය | 2022 | 2021 | 2020 |
|---|---|---|---|
| **අනුපාතය** | | | |
| **ලාභදායිතා අනුපාතය** | | | |
| ශුද්ධ ලාභ අනුපාතය | 80% | 76.04% | 95.19% |
| **ද්‍රවශීලතා අනුපාතය** | | | |
| ජංගම අනුපාතය | 1.14 | 4.81 | 13.15 |
| ක්ෂණික අනුපාතය | 1.13 | 4.8 | 13.12 |

**තෝලන අනුපාතය**

| | | | |
|---|---|---|---|
| යෙද වූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය (ROCE) | 9.6% | 9.6% | 12.27% |
| හිමිකම් මත ප්‍රතිලාභය | 4.7% | 8.99% | 9.61% |
| ණය හිමිකම් අනුපාතය | 0.13 | 0.11 | 0.14 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම වසර 10ක කාලයක් සඳහා හම්බන්තොට මෙහෙයුම් මධ්‍යස්ථානයේ LPG ආනයනය, ගබඩා කිරීම, හැසිරවීම සහ බෙදා හැරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ 2013 නොවැම්බර් 20 වැනි දින බදු ගිවිසුමකට එළඹ තිබුණු අතර පසුව එම බදු ගිවිසුම හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝර්ට් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ් සමඟ 2017 දෙසැම්බර් 08 වැනි දින අලුත් කර ඇත. වසර 8ක් සඳහා එකතු වී තිබුණු බදු කුලිය වූ රු. මිලියන 668.55 (බදු ඇතුළුව) ගෙවා ඇති අතර ඉතිරි වසර දෙක සඳහා එකතු වූ බදු කුලිය වූ රු. මිලියන 233.84 (බදු හැර) 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුය. එකතුව මෙට්‍රික් ටොන් 10,075 ක් වූ ද්‍රව පෙට්‍රෝලියම් වායු නැව්ගත කිරීම් 6ක් පමණක් 2013 නොවැම්බර් 20 සිට 2021 දෙසැම්බර් 31 දක්වා හම්බන්තොට වරායට පැමිණ ඇති බව නිරීක්ෂණය විය. එම නිසා, සැලකිය යුතු මුදලක් කල්බදු කුලී ලෙස ගෙවනු ලැබුවද, සමාගම විසින් මෙට්‍රික් ටොන් 2,700 ක ගබඩා ධාරිතාවක් සහිත එකී පහසුකම පිරිවැය ප්‍රතිලාභ වාසි විශ්ලේෂණය කරමින් සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.<br><br>කෙසේ වුවද, නල මාර්ගයේ කාන්දු වීම හේතුවෙන් පර්යන්තයේ ක්‍රියාකාරිත්වය 2021 පෙබරවාරි 11 සිට අත්හිටුවා ඇත. ඒ අනුව, පර්යන්තයේ මෙහෙයුම් නවතා දමා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් සඳහා රු. මිලියන 12.9 ක් වැය කරමින් එම කාර්ය මණ්ඩලයම පර්යන්තයේ රඳවා ගෙන තිබුණි. | අප සතු ඇතැම් ද්‍රව පෙට්‍රෝලියම් වායු තොග පැවති ඉතිරි ගබඩා පහසුකම් ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලෙස නොව හානියට පත් නල මාර්ගයෙන් ද්‍රව පෙට්‍රෝලියම් වායුව පිටවීම පමණක් අත්හිටුවන ලෙස ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා ලිමිටඩ් ආයතනයෙන් ඉල්ලා තිබුණි.<br>එබැවින්, නල මාර්ග අලුත්වැඩියාව/ප්‍රතිස්ථාපනය සඳහා මනා විසඳුමක් ලැබෙන තුරු, වත්කම්වල අඛණ්ඩතාව පවත්වා ගැනීමට සහ පහසුකමේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අපට ගිවිසුම්ගත බැඳීමක් තිබුණි.<br>එබැවින්, නීති උපදෙස් සහ නියෝගවලට අනුකූලව HIPG සමඟ සාකච්ඡා පවත්වන අතරතුර, 2022 වර්ෂය තුළ පහසුකමේ සුරක්ෂිතතාව සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා සාමාන්‍ය නඩත්තුව / ව්‍යවස්ථාපිත පරීක්ෂාව සිදු කිරීම සඳහා අවම කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීමට අපට සිදු විය. සඳහන් කරන ලද වියදම් 2022 වර්ෂය තුළ ඉහත අවශ්‍යතා හේතුකොටගෙන සිදු කරන ලදී. | සාමාන්‍ය මහජනතාවට සේවය කිරීම යන සමාගමේ අපේක්ෂිත අරමුණ සඳහා මෙම දේපළ භාවිත කිරීමට සමාගම විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත සහ උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 මැයි 24 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී “ලිට්‍රෝ ඔක්සිජන්” නමින් නව නිෂ්පාදන කාණ්ඩයක් ස්ථාපිත කිරීමටත්, අත්තිකාරම් ලෙස රු. මිලියන 500ක් ගෙවා රජයේ තක්සේරුව මත LGTLL මගින් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවෙන් කෙරවලපිටියේ පිහිටි අක්කර 22 ක පමණ වන ඉඩම සහ ගොඩනැගිල්ල වසර 50ක් සඳහා වහාම මිලදී ගැනීමට / දීර්ඝකාලීනව බදු දීමට සහ ඔක්සිජන් පිරවුම්හල ඉදිකිරීමට සහ/හෝ අතිරේක LPG මෙහෙයුම් සහ ගබඩා පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් සඳහා මෙම ඉඩම භාවිත කිරීමට හෝ ඊට අදාළ වෙනත් ඕනෑම කටයුත්තක් සඳහා මෙම ඉඩම භාවිතා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය ලැබී ඇත. ඒ අනුව, මෙම ඉඩම සඳහා අත්තිකාරම් ගෙවීමක් වශයෙන් රු. මිලියන 500ක් 2021 මැයි 31 දින ගෙවා තිබුණි. කෙසේ වුවද, එකී ඉඩමේ ඔක්සිජන් පිරවුම්හල ඉදිකිරීම සඳහා අනුමැතිය අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබා ගෙන නොතිබුණු අතර එම ඉඩම උපයෝජනය කිරීමේ ඉදිරි සැලැස්ම ද තීරණය කර නොතිබුණි. තවද, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව විසින් 2023 ජනවාරි 03 දින සභාපතිවරයාට දන්වා තිබුණේ මාස 01ක කාලයක් තුළ සම්පූර්ණ කල්බදු වාරිකය ගෙවන ලෙසත් එසේ නොමැති නම්, එම ඉඩම වෙනත් ආයෝජනයක් සඳහා වෙන් කරන බවත්ය. කෙසේ වුවද, එම කාල සීමාව තුළ සමාගම මගින් ඉහත කල්බදු වාරිකය ගෙවා නොතිබුණි. | ඉතිරි මුදල ගෙවීම සඳහා සමාගමේ ආර්ථික තත්ත්වය ස්ථාවර වන තෙක් ගෙවීම් කටයුතු අවම වශයෙන් වසර 4 කින් ප්‍රමාද කිරීමට සමාගමට සහාය වන ලෙස සමාගම විසින් මුදල් අමාත්‍යාංශයේ මැදිහත්වීම ඉල්ලා ඇති අතර එම ඉඩම යම් තුන්වන පාර්ශ්වයකට ලබා දීම අමාත්‍ය මණ්ඩල සංදේශයට සහ 2022/5/27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනි වන බව LGTLL විසින් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව (SLLDC) වෙත දැනුම් දී ඇත.<br>ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවේ (SLLDC) යෝජනාවට අනුව, සමාගමට සම්පූර්ණ ගෙවීම එකවර නිරවුල් කිරීමට හැකියාවක් නොමැති බව සමාගම විසින් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව (SLLDC) වෙත දන්වා තිබුණි. එසේම, පක්ෂ දෙකම සාකච්ඡා කර එකඟ වන පොළියක් සහිතව මාස 24ක කාලයක් තුළ, මාසික වාරික වශයෙන් මුළු ගෙවීම සිදු කිරීම සඳහා ප්‍රතිවිරුද්ධ යෝජනාවක් ඉදිරිපත් කර ඇත. ඉඩම බදු දීම සඳහා දෙපාර්ශ්වයම එකඟ වන ගෙවීම් සැලැස්මක් සකස් කර අවසන් කිරීමට අපි දැනට සාකච්ඡා පවත්වමින් සිටිමු. | අදාළ බලධාරීන්ගේ අනුමැතිය ඇතිව, සමාගම විසින් මෙම දේපළ අපේක්ෂිත කාර්යය සඳහා හෝ වෙනත් සුදුසු කාර්යයක් සඳහා හෝ භාවිත කළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අවම වශයෙන් වසර 3ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ප්‍රසම්පාදන සැලැස්මේ ලැයිස්තුගත කර නොතිබුණු අතර, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.1 (ආ) සහ (ඉ) හි දක්වා ඇති පරිදි මාස 6 නොඉක්මවන කාලයක් ඇතුළත ප්‍රධාන ප්‍රසම්පාදන | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම ලබා දී නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සැලැස්ම විධිමත්ව යාවත්කාලීන කර නොතිබුණි. | | |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.2 (අ) මාර්ගෝපදේශයට අනුව, ප්‍රසම්පාදනය ආරම්භ කිරීමේ සිට අවසන් කිරීම දක්වා එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර විස්තර කෙරෙන කාලානුක්‍රමික අනුපිළිවෙල සහිත ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙළ කළ යුතුය. කෙසේ වුවද, සමාගම විසින් එයට අනුව ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙළ කර නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම ලබා දී නොතිබුණි. | -එම- |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ. 134 (1) ට අනුව, අභ්‍යන්තර විගණන ඒකකය මූල්‍ය හා ගිණුම්කරණ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් වගකීම දරන නිලධාරීන්ගෙන් හෝ සත්‍ය වශයෙන්ම මූල්‍ය හා ගිණුම්කරණ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන නිලධාරීන්ගේ පාලනයෙන් ස්වාධීන විය යුතුය. 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2021 මගින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසාය සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 4.4 වගන්තියට අනුව, අභ්‍යන්තර විගණකවරයා ඔහුගේ/ඇයගේ රාජකාරිය ඉටු කිරීමේදී ඔහුගේ/ඇයගේ වාස්තවිකත්වය සහ ස්වාධීනත්වය පවත්වා ගත යුතුය. කෙසේ වුවද, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් වැටුප් හා සම්බන්ධ වවුචරපත්, මිලදී ගැනීමේ ඇණවුම් සහ ආයෝජන කාලසටහන් හැර සියලුම වවුචරපත් පරීක්ෂා කර අනුමත කිරීම සිදු කරයි. 2021 ජූලි 27 සහ 2022 අප්‍රේල් 25 යන දිනවල සභාපති විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර චක්‍රලේඛ මගින් මෙය ආරම්භ කර ඇත. මෙම රාජකාරි විගණකවරුන්ගේ ස්වාධීනත්වයට අභියෝග කරයි. | ක්‍රියාවලිය අනුකූල වන බව සහතික කිරීම සඳහා, ක්‍රියාවලිය අවසන් කිරීමට පෙර අවශ්‍ය සියලුම ලේඛන මනාව පරීක්ෂා කර අනුමත කිරීම වැදගත් වේ. සියලුම අවශ්‍යතා සහ රෙගුලාසි සපුරා ඇති බවත්, සමාගමේ ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියාවලිය ක්‍රියාත්මක කර ඇති බවත් සහතික කිරීමට මෙය උපකාරී වේ. මෙම අනුකූලතා මට්ටම පවත්වා ගැනීම සඳහා, සමාගම අභ්‍යන්තර විගණන හරහා ඔවුන්ගේ මෙහෙයුම්වල නිශ්චිත ක්ෂේත්‍ර සමාලෝචනය කිරීම අඛණ්ඩව සිදු කරයි. | අභ්‍යන්තර විගණන ඒකකය මූල්‍ය සහ ගිණුම්කරණ මෙහෙයුම් කටයුතුවලින් ස්වාධීනව පැවතිය යුතුය. |

**4.2 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) ඡේදයට අනුව සහ රජය සතු ව්‍යවසාය සඳහා | 2022 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය අදාළ පනත් තුළ නිරන්තරයෙන් සිදු වූ වෙනස්කම් සහ | |

| | | |
|---|---|---|
| ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 4.2 මාර්ගෝපදේශයට අනුව, විගණන සහ කළමනාකරණ කමිටුවක් පැවතිය යුතුය. තවද, මාර්ගෝපදේශ 4.2 (ඌ) අනුව, විගණන කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක් රැස්විය යුතුය. කෙසේ වුවද, 2022 වර්ෂය සඳහා ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා ලිමිටඩ් සඳහා එක් විගණන කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | සහ සමාගමට මුහුණ පෑමට සිදු වූ අර්බුදකාරී ගැටලු හේතුවෙන්, නියමිත විගණන කමිටු රැස්වීම් නොපවත්වන ලදී. කෙසේ වුවද, 2022 වර්ෂය තුළ LGLL සඳහා රැස්වීම් තුනක් සහ LGTLL සඳහා එක් රැස්වීමක් පවත්වා තිබුණි. | මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**4.3**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රේඛීය අමාත්‍යාංශය විසින් නම් කරන ලද සභාපතිවරයා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කර තිබුණු අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 වර්ෂයේදී ඔහුව ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් ද පත් කර තිබුණි. රජය සතු ව්‍යවසාය සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 2.2.2 මාර්ගෝපදේශයට අනුව, සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධානියා වන අතර 2.5.1 පරිච්ඡේදයට අනුව, ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකීම වන්නේ ක්‍රමෝපායික, උපායශීලී සහ මෙහෙයුම් සැලසුම් සකස් කිරීමය. මෙම තනතුරු දෙකේම රාජකාරී එකම පුද්ගලයෙකු විසින් ඉටු කිරීම යහපාලන පරිචයන්ට පටහැනිය. | මනා පරිචයන් පවත්වා ගැනිම සඳහා සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරියා එකම පුද්ගලයකු වීම බාධාවක් නොවේ. අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2022/06/13 දිනැති ලිපිය මගින් එම්.එස්.ජී. පීරිස් මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු සහ සභාපතිවරයා වශයෙන් පත් කරන ලදී. එවකට සිටි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනා විසින් 2022/06/16 දින පැවති රැස්වීමේදී එම්.එස්.ජී. පීරිස් මහතාව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු සහ සභාපතිවරයා ලෙස පත් කරන ලදී. එම රැස්වීමේදී, එම්.එස්.ජී. පීරිස් මහතාව LGTLL හි ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත් කරන ලදී. එකී පත්කිරීම සිදු කළ අවස්ථාව වන විට, රට උග්‍ර ද්‍රව පෙට්‍රෝලියම් වායු හිඟයකට මුහුණ දී තිබුණු අතර සමස්ත මෙහෙයුම් කටයුතු ඇනහිට තිබුණි. එකී හේතුව මත සහ පිරිවැය ඵලදායීතාවය සඳහා එම්.එස්.ජී. පීරිස් මහතා LGTLL හි සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත් කරන ලදී. එම්.එස්.ජී. පීරිස් මහතා සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත් කිරීම සම්බන්ධයෙන් වාර්ෂික වාර්තාවේ සුදුසු අන්දමින් අවධාරණය කරන ලදී. | සමාගම විසින් මනා යහපාලන පිළිවෙත් අනුගමනය කළ යුතුය. |